මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව - 2019

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවෙහි 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතිය යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරි බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාල වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය පූකාශන පිළියෙළ කිරීමට අවශ්‍ය වන පරිදි ගණුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරි බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානු වලදී සැසදීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් සභාව විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත 01 හි 99 ඡේදය ප්‍රකාරව කාලපරිච්ඡේදය තුළ හඳුනාගත් සියලුම ආදායම් සහ වියදම් අයිතම ලාභ හෝ අලාභවල ඇතුළත් කළ යුතු වුවත්,සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන විදේශ පුහුණු වැඩසටහන් වෙනුවෙන් ලද රු. 14,693,000 ක ආදායම සහ ඉන් දරන ලද රු.15,364,900 ක වියදම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමකින් තොරව රු. 671,900 ක ශුද්ධ අගය පමණක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආදායම් යටතේ සෘණ අගයක් ලෙස දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී මේ පිළිබඳ නිවැරදි තොරතුරු වාර්තා කිරීමට උපදෙස් දෙන ලදී. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 ප්‍රකාරව අස්පෘශ්‍ය වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් යටතේ වෙනම දැක්විය යුතු වුවද ශුද්ධ වටිනාකම රු. 324,653 ක් වූ පරිගණක මෘදුකාංග සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. ඉදිරි වර්ෂ වලදී ගිණුම් පිළියෙල කිරීමේදී ප්‍රමිතවලට අනුකූලව කටයුතු කිරීමට උපදෙස් දෙන ලදී . | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පසුගිය වර්ෂයකදී උපදේශකවරයෙකුට ගෙවීම වෙනුවෙන් වෙන්කරන ලද රු. 250,000 ක මුදල අතීතානුයෝගීව ගැලපීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ විවිධ ආදායම් ලෙස ගිණුම්ගත කිරීම සහ විදේශ පුහුණු වැඩසටහනක් වෙනුවෙන් භාහිර ආයතන දෙකකින් ලබාගත් රු. 900,000 ක මුදල අදාල වැඩසටහන ක්‍රියාත්මක නොකිරීම නිසා ගෙවිය යුතු වියදම් ලෙස දැක්වීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය රු. 1,150,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | එකඟ වෙමි. | ආදායම් වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. එසේම සිදුවී ඇති ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුළ දී ගෙවන ලද රු. 96,687 ක් වූ පාරිතෝෂික මුදල පාරිතෝෂික වෙන් කිරීමේ ගිණුමට හර කිරීම වෙනුවට වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල වර්ෂයේ ඌනතාවය වැඩියෙන් දක්වා තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයට අදාළ පාරිතෝෂික ප්‍රතිපාදනය විගණනයේ ගණනය කිරීම් අනුව රු. 2,999,559 ක් වුවද ආයතනයේ ගණනය කිරීම් අනුව එම වටිනාකම රු. 3,227,167 ක් වූයෙන් රු. 227,608 ක අධි වෙන්කිරීමක් නිරීක්ෂණය විය. | එකඟ වෙමි. | වර්ෂයේ වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු අතර පාරිතෝෂිත ප්‍රතිපාදන නිවැරදිව ගණනය කළ යුතුය. එසේම සිදුවී ඇති ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂය තුළ දී නිකුත් කරන ලද රු.130,000 ක් වූ චෙක්පත වර්ෂය තුළදීම අවලංගු වී තිබුණ ද එම වගකීම නැවත ගිණුම්වල දක්වා නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ජංගම වගකීම් ඉහත ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | එකඟ වෙමි | අවලංගු වූ චෙක්පත් නිවැරදිව ගිණුම්ගත කල යුතු අතර සිදුවී ඇති ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.4** නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) ලී බඩු සහ | | | | | මූල්‍ය ප්‍රකාශන සකස් |

| | | | | | |
|---|---|---|---|---|---|
| උපකරණ | **4,484,257** | **4,988,000** | **103,743** | ආයතනය සතුව ඇති තොරතුරු අනුව ගණනය කිරීම් සිදු කර ඇත. වර්ෂ ගණනාවක සිට පැවත එන වෙනස්කම් ගැන පැහැදිලි කිරීමට නොදනී. | කිරීමේදී ස්ථාවර වත්කම් උපලේඛන සහ ලෙජර් ගිණුම් අතර සැසඳීමක් කර නිවැරදි තොරතුරු වාර්තා කල යුතුය. |
| (ආ) වාහන | **15,227,342** | **14,530,900** | **806,542** | ආයතනය සතුව ඇති තොරතුරු අනුව ගණනය කිරීම් සිදු කර ඇත. වර්ෂ ගණනාවක සිට පැවත එන වෙනස්කම් ගැන පැහැදිලි කිරීමට නොදනී. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ස්ථාවර වත්කම් උපලේඛන සහ ලෙජර් ගිණුම් අතර සැසඳීමක් කර නිවැරදි තොරතුරු වාර්තා කල යුතුය. |

**1.6** තොරතුරු තාක්ෂණ **(IT)** පොදු පාලන ක්‍රම

-----------------------------------------------

| අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මානව සම්පත් සංවර්ධන සභාව විසින් සිය ගිණුම්කරණ ක්‍රියාවලිය සඳහා " Quick Book " ගිණුම්කරණ මෘදුකාංගය භාවිතා කර තිබුණි. ඒ සඳහා නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන අනුමැතියෙන් පසුව අදාල ලෙජර් ගිණුම් සඳහා නැවත නැවතත් ගැලපීම් ඇතුලත් කිරීමට හා පවතින ගැලපීම් ඉවත් කිරීමට හැකියාව පැවතුණි. එමෙන්ම මෙම ගිණුම්කරණ මෘදුකාංගය අනුව ගිණුම් වර්ෂයක් අවසානයේ ගිණුම් ශේෂයන් ස්වයංක්‍රීයව ඉදිරියට ගෙන යාමක් සිදු වී නොතිබුණු අතර ඉදිරි වර්ෂයට ආරම්භක ශේෂ නැවත ඇතුලත් කිරීම ( Manually) කළ යුතුව තිබුණි. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශනයන් හි සංසන්දනාත්මක තොරතුරු වල නිරවද්‍ය බව පිළිබඳ තහවුරුවක් නොතිබුණි. | එකඟ වේ. තිබෙන ප්‍රතිපාදන අනුව නව ගිණුම්කරණ මෘදුකාංගයකට මාරු වීමකට අපහසුය. ඉදිරි වර්ෂවල දී සලකා බැලීමට එකඟ වෙමි. | ගිණුම්කරණ පද්ධතිය තුළින් වැරදි හා වංචා ඇති නොවන පරිදි පාලන ක්‍රම හඳුන්වා දිය යුතුය. |

**2.** මූල්‍ය සමාලෝචනය

----------------------

**2.1** මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. **1,852,255** ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. **5,596,047** ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. **7,448,302** ක පිරිහීමක් නිරීක්ෂණය විය.

**3.** මෙහෙයුම් සමාලෝචනය

----------------------------

**3.1** මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතේ **14 (1) (2)** ඡේදය අනුව සභාවේ කාර්යභාරය සහ එම කාර්යභාරය ඉටු කිරීමේදී පරිපාලනය, අධ්‍යාපනය, සේවා නියුක්තිය, විද්‍යාව හා තාක්ෂණය, හිමිකම් හා ජනගහනය යන විෂය කරුණු ගැන විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු බව දක්වා තිබුණි .එහෙත් “අනාගතය සඳහා සූදානම් ශ්‍රම බලකායක්”යන දැක්ම යටතේ මෙම ආයතනය ක්‍රියාත්මක වීම සහ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරීත්වය සලකා බැලීමේදී ඉහතකී පුළුල් ක්ෂේත්‍රය ආවරණය වන පරිදි දීර්ගකාලීන වැඩපිළිවෙළක් යටතේ මෙම සභාව ක්‍රියාත්මක වී නොමැති බව නිරීක්ෂණය විය. | **2015** වර්ෂයේදී එවකට පැවති රජයේ දැක්මට අනුගත වන ආකාරයට “අනාගතය සඳහා සූදානම් ශ්‍රම බලකායක් “යන දැක්ම යටතේ සභාවේ ඉදිරි පස් අවුරුදු සැලැස්ම තුළ මෙම සියළු කරුණු ආවරණය වන පරිදි කටයුතු සිදු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර ඇත. මේ සඳහා දැනටමත් සම්පත් දායකයින් දෙදෙනෙකුගේ සේවය ලබාගෙන නව රජයේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්තියට අනුව මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය සැකසීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | සභාව ආරම්භ කිරීමේ අරමුණු ඉටුවන පරිදි අපේක්ෂිත වැඩසටහන් ක්‍රියාත්මක කල යුතුයි. |
| (ආ) මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභා පනතේ **16 (2) (ඊ)** ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධනය සහ ඊට සම්බන්ධ ක්ෂේත්‍ර පිළිබඳව තොරතුරු ඇතුලත් දත්ත බැංකුවක් පිහිටුවා පවත්වාගෙන යාමේ බලතල සභාව සතු වුවත් සභාවේ අරමුණු ඉටුකර ගැනීමට පහසුවන පරිදි අවශ්‍ය තොරතුරු ඇතුලත් යාවත්කාලීන වූ දත්ත බැංකුවක් පවත්වාගෙන යාමට සමාලොචිත වර්ෂය නිමවන විටත් කටයුතු කරනොතිබුණි. | එකඟ වෙමි.<br>**2020** වර්ෂයේ සිට මානව සම්පත් සංවර්ධනය පිළිබඳ තොරතුරු පද්ධතියක් පිහිටුවා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මූලික සාකච්ජාව **ICTA** ආයතනය සමග **2020.09.28** දින පවත්වන ලද අතර ඉදිරි කටයුතු ආයතනයේ කෙටි කාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන සැලැස්මට ඇතුලත් කර ඇත. | සභාව ආරම්භ කිරීමේ අරමුණු ඉටුවන පරිදි අපේක්ෂිත වැඩසටහන් ක්‍රියාත්මක කල යුතුයි. |

**4.** ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

**4.1** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **2003** ජුනි **02** දිනැති අංක පීඊඩී **/12** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ **6.5.1** වගන්තිය සහ **2004** පෙබරවාරි **24** දිනැති අංක **01/2004** දරන භාණ්ඩාගාර චක්‍රලේඛය පරිදි ගිණුම් වර්ෂය අවසන් වී දින **60** ක් තුල මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද සභාව විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම **2020** අගෝස්තු **10** දින දක්වා වුවද ප්‍රමාද කර | පාලක මණ්ඩල සාමාජිකයන් පත්කිරීම **2020.03.04** වන දින දක්වා ප්‍රමාද වීම සහ අනතුරුව එළඹි කොවිඩ්-**19** වසංගත තත්ත්වය හේතුවෙන් **2020** වසර සඳහා පළමු පාලක මණ්ඩල රැස්වීම පැවැත්වූයේ **2020.07.16** වන දිනදීය. අනතුරුව එම රැස්වීමට අදාල වාර්තාව සකසා අවසන් වූ පසුව මූල්‍ය ප්‍රකාශනය | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට පෙර ඉදිරිපත් කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවිය යුතුය. |

| | | |
|---|---|---|
| තිබුණි. | ඉදිරිපත් කර ඇත. | |

**4.2** වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 නොවැම්බර් 06 දිනැති අංක DPMM/DG/037 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය මඟින්, රාජ්‍ය ආයතන විසින් තම ඉලක්කයන් ළඟාකර ගැනීම සඳහා අවධානය යොමු කළ යුතු ප්‍රමුඛතා ක්ෂේත්‍රයන් හඳුනා ගෙන ඒවායෙහි නිමැවුම (output) සහ ප්‍රතිඵලය (outcome) මැනිය හැකි වන පරිදි මූලික කාර්යසාධන දර්ශක ස්ථාපිත කිරීමට සහ ඒ අනුව අඛණ්ඩව කාර්යසාධනය මැනිය හැකි වන පරිදි ආයතනික ප්‍රතිඵල රාමුවක් (Organizational results frame work) සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ ලබා දී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය නිම වන විටත් අදාල කටයුත්ත නිසි පරිදි සිදුකිරීමට සභාවට නොහැකිවී තිබුණි. | විධිමත් පරිදි ක්‍රියාකාරී සැලැස්ම සකස් කලද නැවත අමාත්‍යාංශය විසින් ලබා දෙන ලද නව ආකෘතිය අනුව සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රතිඵල තීරුව ඇතුලත් වී නොමැත. එබැවින්, අමාත්‍යාංශය විසින් ලබාදෙන ආකෘතිය අනුව සකස් කිරීම නිසා මෙය සිදුවී ඇත. තවද, ක්‍රියාකාරී සැලැස්මෙහි දැක්ම (vision, Mission) ඇතුළත් කර නොමැති වුවත් 2015 සිට සියළුම වැඩසටහන් එවකට පත්වූ නව රජය යටතේ අනාගත ශ්‍රම බලකායක් යන දැක්ම යටතේ ප්‍රධාන trust area 5 ක් යටතේ සියලු ක්‍රියාකාරකම් පෙළගස්වා ක්‍රියාත්මක කරන ලදී. | ආයතනය ආරම්භ කිරීමේ අරමුණ සහ ජාතික ප්‍රතිපත්ති වලට අනුගත වන පරිදි ඉදිරි දැක්මක් සහිත ක්‍රියාකාරී සැලැස්මක් මත ආයතනය ක්‍රියාත්මක කළ යුතුය. |